12295

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

24 - 11 - 2016

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 09 | පෙරදිග සංගීතය | I,II | පැය 02 |

නම :- .................................................... විභාග අංකය :- ..........................

## I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) යමන් රාගයේ සුවිශේෂ ලක්ෂණයකි.

(1) නි, ග වාදී සංවාදී වීම (2) ම, ස වාදී සංවාදී වීම
(3) කාෆි ථාටයෙන් ජනිත වීම (4) මධ්‍යමය තීව්‍ර වීම

(02) භීම්පලාසී රාගයේත්, කාෆි රාගයේත් පොදු ලක්ෂණයකි.

(1) ම, ස වාදී සංවාදී වීම (2) ඖඩව - සම්පූර්ණ ජාතියට අයත් වීම
(3) ග, නි ස්වර කෝමල වීම (4) රාත්‍රී දෙවන ප්‍රහරයේ ගායනය

(03) රි, ධ ස්වර දෙක පිළිබඳ වඩාත් නිවැරදි කියමන වන්නේ,

(1) භීම්පලාසි රාගයේ ආරෝහණයේ වර්ජිත ස්වර දෙකයි
(2) භූපාලි රාගයේ නොයෙදෙන ස්වර දෙකයි
(3) භීම්පලාසි රාගයේ වාදී සංවාදී ස්වර දෙකයි
(4) යමන් රාගයේ විවාදී ස්වර දෙකයි

(04) ජප් තාලයට අනුව විභාග වී ඇති ස්වර පාදයකි,

(1) ස -| ස රි ග | ම ග | රි ග රි -| (2) ස රි ග | ස රි ග | ම ග රි | ස - -|
(3) සස ස | රිග රි සස | මග රි | ගම ප ප | (4) සරි ස - | රි ග ම - | ගම ග - | ග ම ධ - |

(05) ගමප පප- | ගමග පම- | මෙම පෙරදිග ස්වර ප්‍රස්තාර කොටස සඳහා බටහිර ප්‍රස්තාර ක්‍රමයේ දී යොදා ගන්නා Time Signatura (තාල සංකේතය) වන්නේ,

(1) $\frac{4}{4}$ (2) $\frac{3}{4}$ (3) $\frac{2}{4}$ (4) $\frac{6}{8}$

(06) හින්දු දෙව්වරුන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් ගැයෙන උත්තරභාරතීය සරල ශාස්ත්‍රීය ගීත ශෛලිය වන්නේ,

(1) භජන් (2) කව්වාලි (3) ඛ්‍යාල් (4) ප්‍රශස්ති

(07) අඩු ලයකින් ගැයෙන ආසාතාත්මක මෙහෙ ගී විශේෂයකි.

(1) කමත් ගී (2) ගොයම් ගී (3) නෙළුම් ගී (4) පතල් ගී

(08) 'අඩහැරය පෑම' සිදු කරන ගොවිතැනෙහි සුවිශේෂී අවස්ථාව වනුයේ,

(1) ගොයම් කැපීම (2) ගොයම් නෙළීම (3) ගොයම් පෑගීම (4) පැල සිටුවීම

Learning Resource Center
De Mazenod College
Kandana

(09) හේවිසි වාදනය මෙන්ම අවමංගල උත්සව සඳහා යොදා ගන්නා බෙර යුගලය
(1) ගැටබෙරය - දවුල (2) දවුල - පහතරට බෙරය
(3) දවුල - තම්මැට්ටම (4) දවුල - හොරණෑව

(10) පාසල් තූර්යවාදක කණ්ඩායමක පහතරට බෙරයෙන් වයන පද කොටසකි,
(1) ජෙං කිටි කිටි තක (2) ගුම් ගුඳ ගදිගත
(3) දොං දොං ජිංගත (4) ජෙං ජෙං තක්කිට

(11) ඩබ්. බී. මකුලොලුව ශූරීන්ගේ 'දෙපානෝ' නාට්‍යය,
(1) අර්ධ ශෛලිගත නාට්‍යයකි (2) ශෛලිගත නාට්‍යයකි
(3) ගීත නාට්‍යයකි (4) මුද්‍රා නාට්‍යයකි

(12) කැලණි පාලම, තාරාවෝ ඉගිලෙති වැනි නාට්‍ය හඳුන්වනේ,
(1) මුද්‍රා නාට්‍ය ලෙස (2) තාත්වික නාට්‍ය ලෙස
(3) ශෛලිගත නාට්‍ය ලෙස (4) අර්ධ ශෛලිගත නාට්‍ය ලෙස

(13) ජන සංගීතයේ ශාන්ති කර්ම නාද රටා පාදක කර ගනිමින් නිර්මාණය වූ නාට්‍ය ගීතයක් සහ එම නාට්‍ය වන්නේ,
(1) හතික වරෙව් කොල්ලනේ - බෙරහඩ (2) හෙළ ගැඹුරුයි - හුණු වටයේ කථාව
(3) දිකිරි දිකිරි - රතු හැට්ටකාරී (4) සත්සියක් කපු මල් - කුවේණි

(14) බටහිර සංගීතයේ හාර්මනි සිද්ධාන්තයට අනුව | ස - ග රි | ග - ප - | යන ස්වර කොටස සඳහා හාර්මනි වන ස්වර ඛණ්ඩය
(1) | රි - ග ම | ප - ධ - | (2) ග - ප ම | ප - ස් -
(3) | ග - ම ප | ධ - ප - | (4) ග - ප ධ | නි - ධ -

(15) සංගීත ප්‍රසංගයක භාවිත කරන තාක්ෂණික මෙවලම් අතරින් ශබ්දය වැඩි කිරීමේ කාර්යය සිදු කරන උපකරණය
(1) Speaker (ස්පීකර්) (2) Amplifier (ඇම්ප්ලිෆයර්)
(3) Buffel (බෆල්) (4) Microphone (මයික්‍රොෆෝන්)

(16) පැල් ගී, තුන් සරණේ ගී, රබන් ගී.... මෙම ගීත වර්ග තුන පිළිවෙලින් අයත් වන්නේ,
(1) ඇඳහිලි ගී, මෙහෙ ගී, සමාජ ගී (2) මෙහෙ ගී, ඇඳහිලි ගී, සමාජ ගී
(3) මෙහෙ ගී, සමාජ ගී, ඇඳහිලි ගී (4) සමාජ ගී, මෙහෙගී, ඇඳහිලි ගී


(17) ගායනය සඳහා සහාය වාද්‍ය භාණ්ඩයක් වශයෙන් යොදා ගත හැකි බටහිර තත් වාද්‍ය භාණ්ඩය වන්නේ,
(1) වයලීනය (2) බේස්ගිටාරය (3) බොක්ස් ගිටාරය (4) ඇකෝඩියනය

(18) බටහිර සංගීතයේ භාවිතවන හඬතල අතරින් වයලීනය හා වියොලාව යන සංගීත භාණ්ඩ වලින් නිකුත්වන හඬතල වන්නේ,
(1) Soprano(සොප්රානෝ) - Tener (ටෙනර්)
(2) Soprano (සොප්රානෝ)
(3) Alto (ඇල්ටෝ) - Tener (ටෙනර්) - Alto (ඇල්ටෝ)
(4) Tener (ටෙනර්) - Bass (බේස්)

(19) C D E F G A B C යනු,

(1) C මේජර් ස්කේලයයි (2) F මේජර් ස්කේලයයි

(3) G මේජර් ස්කේලයයි (4) B♭ මේජර් ස්කේලයයි

(20) 

Trible clef ට්‍රිබල් ක්ලෙෆ් එකෙහි ප්‍රස්තාරගතව ඇති මෙම ස්වරය වන්නේ,

(1) C sharp (C ෂාප්)

(2) F sharp (F ෂාප්)

(3) E Flat (C ෆ්ලැට්)

(4) D sharp (D ෂාප්) (ලකුණු 1 බැගින් 20 කි.)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) (1) නි̣ ධ̣ , නි̣ රි ස , නි̣ ධ̣ , නි̣ රි ග රි ස ...... මෙම රාගාශ්‍රිත ස්වර අභ්‍යාසය (පල්ටාව) උච්ච ෂඩ්ජය දක්වා වර්ධනය කරන්න. (ලකුණු 03)

(2) එම ස්වර කොටස් අදාල වන රාගය කුමක් ද? (ලකුණු 02)

(3) කාෆි මේලගත රාගයේ මධ්‍යලය ගීයක හෝ සර්ගම් ගීයක ස්ථායි කොටස ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

(02) දේශීය සංගීත භාණ්ඩ සම්බන්ධව පහත දක්වා ඇති වගුව සම්පූර්ණ කරන්න.

| භාණ්ඩය | විශේෂ ලක්ෂණය | භාවිතවන අවස්ථා | භාණ්ඩ ගණය |
|---|---|---|---|
| A ...................... | අතින් සහ කඩිප්පුවෙන් වයයි | F ...................... | I ...................... |
| B ...................... | D ...................... | මඟුල්බෙර වාදනය | ආතත |
| තම්මැට්ටම | E ...................... | G...................... | J...................... |
| C ...................... | හයිගහන පැත්ත සහ සුරල් පැත්ත | H...................... | ආතත |

(ලකුණු 1 × 10 = 10)

(03) පහත දක්වෙන ස්වර පාදයන්ගෙන් A, B පාද මධ්‍ය මධ්‍යමභාවයෙන් ද Ċ, D පාද පංචම භාවයෙන්ද පෙරලා ලියන්න.

A |ස ස රි රි | <u>ග</u> <u>ග</u> ම ම | ප - - ම | ප ධ <u>නි</u> ස්̇

B |<u>නි̣</u> ස | ම <u>ග</u> රි | ස - | ප̣ <u>නි̣</u> ස |


C |ප ප ම ම | ග ග රි රි | ස රි ග ම | ප - - - |

D |නි ධ - ප | ම́ ප ග ම́ | ප - - - | ප ම́ ග රි | (ලකුණු 2 1/2 × 4 = 10)

(04)

| සරල ගීතය | සමීප ගායන ශෛලිය |
|---|---|
| සුවදේ මට සීතල සුලඟ | ජන ගී නාද රටා |
| දෑතට වලලු | කව්වාලි ශෛලිය |
| පුදමු මේ කුසුම් | කැලිප්සෝ ශෛලිය |
| මුළු ගතම වෙහෙසුනා | භජන් ශෛලිය |

(1) වගුවෙහි සඳහන් ගීත සහ ගායන ශෛලීන් නිවැරදිව ගලපා නැවත ලියන්න. (ලකුණු 04)
(2) කව්වාලි, භජන් ගායන ශෛලීන්හි ලක්ෂණ 2 බැගින් ලියන්න. (ලකුණු 04)
(3) කැලිප්සෝ වාද්‍ය වෘන්දයක ඇතුළත් සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(05) 

(1) මෙම ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට ලියා දක්වන්න. (ලකුණු 05)
(2) මෙම ස්කේලය කුමක් ද? (ලකුණු 02)
(3) සෙමිබ්‍රිව්, මිනිම්, ක්‍රොචට් යන තාල සංකේත රේඛා මණ්ඩල ප්‍රස්තාරයක ඇඳ දක්වන්න. (ලකුණු 03)